# ඌව පළාත් සභාව 2020 වර්ෂය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ඌව පළාත් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2021 ඔක්තෝබර් 25 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 ඔක්තෝබර් 22 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙතද, වාර්තාවේ පිටපත 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(2) වගන්තිය ප්‍රකාරව පළාත් සභාව ඉදිරියේ තැබීම සඳහා ආණ්ඩුකාරවරයා වෙතද ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා වන පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දේපළ පිරියත හා උපකරණ අත්පත් කර ගැනීමේදී හෝ අපහරණය කිරීමේදී අදාළ වර්ෂ සඳහා ක්ෂය ගණනය කිරීම සම්බන්ධයෙන් අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය හෙළිදරව් කර නොතිබුණි. | දේපළ පිරියත උපකරණ වර්ෂ අවසානයේ පවතින ශේෂය පදනම් කරගෙන ක්ෂය කිරීම් සිදුකර ඇත. විවිධ ආයතන වලට අදාළව පළාත් අරමුදලේ වත්කම් නියෝජනය වන අතර ඒවා විවිධ දින වකවානුවලදී ලබාගත් ඒවාය. ඒ අනුව කාලපරිච්ඡේදය අනුව ක්ෂය ගණනය කිරීමට විශාල කාලයක් ගතවන අතර ප්‍රායෝගිකව අපහසුතා ඇති කරයි. | අනුගමනය කරනු ලබන ගිණුම්කරණ ප්‍රතිපත්තිය නිවැරදිව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර එම ප්‍රතිපත්තියට අනුව ක්ෂය ගණනය කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති එකතුව රු. 143,656,105 ක් වූ ලැබිය යුතු බදු හා බදු නොවන ආදායම් ගිණුම්ගත කර නොතිබුණි. | ආදායම් ගිණුම්ගත කිරීම මුදල් පදනම මත සිදුකරන බව ගිණුම්කරණ ප්‍රතිපත්තියවල හෙළිදරව් කර ඇත. රජයේ ගිණුම් තැබීමේදී මෙම බදු ආදායම ලැබීමට ප්‍රථම බිල් කිරීමක් සිදු නොවන බැවින් උපචිත පදනම මත ගිණුම් තැබීමක් කළ නොහැක. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් විෂයයන් උපචිත පදනම මත ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | 1980 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තිය ප්‍රකාරව පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | මුද්දර ගාස්තු නැවත පළාත් පාලන ආයතනය වෙත ගෙවීම සඳහා බැඳීමක් පැවතියද, මෙම බැරකම නිරවුල් කිරීම සඳහා ප්‍රඥප්තියේ ප්‍රකාර යම් කොන්දේසි සපුරාලිය යුතු බැවින් මෙය නෛතික අසම්භාව්‍ය බැරකමක ස්වරූපයක් ගනී.<br>ඒ අනුව මුද්දර ගාස්තු නියමිත ආදායම් ශීර්ෂයක් යටතේ පළාත් අරමුදලට බැර කරන අතර, එම අසම්භාව්‍ය බැරකම් නිරවුල් කිරීමට සිදු වුවහොත්, 1993 අංක 05 දරන මුද්දර ගාස්තු හැරවීමේ ප්‍රඥප්ති ප්‍රකාරව පළාත් පාලන ආයතන වෙත නැවත ගෙවීම සඳහා වාර්ෂික මුදල් ප්‍රඥප්තියෙන් නෛතික අසම්භාව්‍ය බැරකමක් වෙනුවෙන් වැය විෂය අංක 1504 යටතේ ප්‍රතිපාදන සලසා ඇත.දැනට මේ සම්බන්ධයෙන් ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධාන සංශෝධනය සම්බන්ධව සමලෝචනයක් සිදු වන අතර එම විධිවිධාන සංශෝධනයෙන් පසුව ඒ අකාරයෙන් කටයුතු කිරීමේ හැකියාව පවතී. ඒ වන තුරු පවතින විධිවිධාන අනුව කටයුතු කිරීම රජයේ වගකීමක් වන අතර ඒ අනුව ගිණුම් සකස් කර ඉදිරිපත් කර ඇත. | පළාත් පාලන ආයතන වලට ගෙවිය යුතු මුද්දර ගාස්තු වටිනාකම පිළිබඳව අනුගමනය කරනු ලබන ක්‍රියාමාර්ගය ගිණුම් වල ප්‍රතිපත්තියක් ලෙස අනාවරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ඌව පළාත් සභාවට එරෙහිව විවිධ පුද්ගලයින් හා ආයතන විසින් පවරා ඇති නඩු කටයුතු හඳුනාගෙන ඊට අදාළ තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | පළාත් සභා අරමුදලින් නිශ්චිතව ගෙවිය යුතු අසම්භාව්‍ය බැරකම් හඳුනා ගැනීමක් සිදු නොවූ හෙයින් පළාත් සභා අරමුදලේ හෙළිදරව් කර නැත. ඉදිරියේදී එවැනි නිශ්චිතතාවයන් සනාථ කිරීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | වගකීම නිශ්චය නොවුවද අසම්භාව්‍ය බැරකම් ගිණුම් වලට සටහනක් ලෙස මූල්‍ය ප්‍රකාශන වලින් හෙළිදරව් කළ යුතුය. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වියදම්හි ශුද්ධ ප්‍රතිපාදනවල එකතුව මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව රු. 23,735,112,000 ක් වුවද, පළාත් භාණ්ඩාගාරයේ පොත් අනුව රු. 25,665,056,250 ක් වූයෙන් රු. 1,929,944,250 ක වෙනසක් නිරීක්ෂණය විය. | සටහන් 06 නිවැරදිව දක්වා ඇති නමුත් ප්‍රමාද දෝෂයකින් මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයෙහි නිවැරදි කිරීමට නොහැකි වී ඇත. එහෙයින් වෙනස සිදුවී ඇත. | මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනයේ දැක්වෙන පුනරාවර්තන වියදම් වල ශුද්ධ ප්‍රතිපාදන, පළාත් භාණ්ඩාගාරයේ පොත් සමඟ එකඟ විය යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ආයතන 03 ක් විසින් සකස් කරන ලද වාණිජ අත්තිකාරම් ගිණුම්වල පළාත් භාණ්ඩාගාරයට ගෙවිය යුතු අත්තිකාරම් ශේෂ දක්වා නොතිබුණු අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව පියවිය යුතු අත්තිකාරම් ශේෂය රු. 4,777,252 ක් විය. | වාණිජ අත්තිකාරම් ගිණුම් සම්බන්ධයෙන් නොපියවූ අග්‍රිම ශේෂ පවතින අතර ඒවා අදාළ වාණිජ අත්තිකාරම් ගිණුම් වලින් අයකර ගැනීමට හා ඊට අදාළ සටහන් නොපවතින්නේ නම් ඒ සඳහා අවශ්‍ය ගැලපීම් සිදු කර අවශ්‍ය අයකර ගැනීම් කිරීමට කටයුතු කෙරේ. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් තොරතුරු අදාළ ආයතනවල තොරතුරු සමඟ එකඟ විය යුතුය. |
| (උ) | ඌව පළාත් සභාවේ කාර්යාල 04 ක විසර්ජන ගිණුම්වල මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනය - ඒසීඒ 6 හි ඇතුළත් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුළු වත්කම් ශේෂ එදිනට පළාත් භාණ්ඩාගාර පොත්වල සඳහන් අනුරූප ශේෂ සමඟ සැසඳීමේදී රු. 14,129,136 ක වෙනසක් නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි. | ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් තොරතුරු භාණ්ඩාගාර පොත්වල දැක්වෙන තොරතුරු සමඟ එකඟ විය යුතුය. |

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් ඉදිරිපත් කිරීම සහ වංචා හා වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල  කිරීමට හැකිවන  පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ.  සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත.  වංචා සහ වැරදි  තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී.  මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරනලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස  පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.5.1 ශීර්ෂය 702- රාජ්‍ය සේවා කොමිෂන් සභාව

පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය හා ගොඩනැගිලි අධ්‍යක්ෂ කාර්යාලය පිහිටා ඇති පරිශ්‍රය තුළ පැතිර පැවති අධික මදුරු ගහණය ඩෙංගු වසංගත තත්ත්වය පැතිරීමට හේතු විය හැකි අතර කාර්යය මණ්ඩලය ඇතුළු අවට මහජන ප්‍රජාවට ඇතිවිය හැකි බලපෑම පිළිබඳ අවධානය යොමුකර මදුරු උවදුර වලක්වා ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රජා සෞඛ්‍යයට ඇතිවිය හැකි බලපෑම් කෙරේ අවධානය යොමුකර ආයතනික කටයුතු පවත්වාගත යුතුය. |

1.5.2 ශීර්ෂය -704 – ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය

(අ) ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අයත් කුඩා ශ්‍රවණාගාරය මසකට රු. 30,000 ක කුලී පදනම මත ඌව පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා බදු දීම වෙනුවෙන් ඊට අදාළ ගිවිසුම ප්‍රකාරව 2015 පෙබරවාරි මස සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දක්වා වූ කාලය සඳහා අයවිය යුතුව තිබුණු හිඟ බදු කුලී රු. 2,130,000 ක් අයකරගෙන නොතිබුණි. | මෙම ආයතන දෙකම ඌව පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පාලනය වන අතර ආයතන දෙක සඳහාම වැයබර එමගින් දරනු ලැබේ. එබැවින් ග්‍රාම සංවර්ධන | ගිවිසුම් ප්‍රකාරව හිඟ බදු කුලී අයකර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | දෙපාර්තමේන්තුව වෙනුවෙන් ගොඩනැගිලි කුලී ගෙවීම අමාත්‍යාංශයට අතිරේක වැයබරක් වීම හේතුවෙන් ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ගොඩනැගිලි කුලී අයකර නොගැනීමට 2020 සැප්තැම්බර් 18 දින පුස්තකාල සේවා මණ්ඩල අධ්‍යක්ෂ මණ්ඩලය ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන ඇත. | |

(ආ) අධ්‍යාපනය සම්බන්ධ කාර්ය මණ්ඩල පරිපාලනය

| | | |
|---|---|---|
| 2006 අප්‍රේල් 25 දිනැති අංක 6/2006 හා 2006 නොවැම්බර් 10 දිනැති අංක 6/2006(ii) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව 2006 ජනවාරි 01 දින සිට රාජ්‍ය සේවයට නව බඳවා ගැනීම් සිදු කිරීමේදී අදාළ නිලධාරීන් පත්කරනු ලැබූ තනතුරට නියමිත වැටුප් පරිමාණයේ ආරම්භක පියවරේ පිහිටුවිය යුතුය. එහෙත් 2006 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ඌව පළාත් සභාව විසින් බඳවා ගන්නා ලද පාසල් පුස්තකාල සේවක, පාසල් රසායනාගාර සේවක හා පාසල් මුරකරු තනතුරු 778 ක් සඳහා III ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවීම වෙනුවට II ශ්‍රේණියට බඳවාගෙන එම ශ්‍රේණියේ ආරම්භක වැටුප් පියවරේ පිහිටුවා 2006 නොවැම්බර් මස සිට සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා මූලික වැටුප් ලෙස රු. 132,825,714 ක් වැඩිපුර ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් ජාතික වැටුප් කොමිෂන් සභාවේ ලේකම්ගේ 2020 ජුනි 12 දිනැති අංක NSCC/12/78/2/1/SR ලිපියේ 03(ii) ඡේදය අනුව නියමිත ශ්‍රේණියේ සහ වැටුප් තලයේ පිහිටුවා අදාළ වැටුප් තලයට එළඹෙන තෙක් ඉදිරි වැටුප් වර්ධක ලබානොදී, මෙම වැඩිපුර ගෙවා තිබූ රු. 132,825,714 ක මුදලක් වැටුප් වර්ධක වලින් හිලව් කිරීමට සුදුසු බව දක්වා තිබුණ ද එසේ කටයුතු කර නොතිබුණි. | මෙම වැඩිපුර ගෙවීම් අදාළ නිලධාරියා නියමිත තනතුරට හා ශ්‍රේණියට අදාළ වැටුප් තලයට එළඹෙන තෙක් ඉදිරි වැටුප් වර්ධක ලබානොදී වැටුප් වර්ධක වලින් හිලව් කිරීමට කටයුතු කරනු ලබන බැවින් ගැටළුව නිරාකරණය වේ. | වැඩිපුර ගෙවා ඇති මුදල අයකර ගත යුතුය. |

(ඇ) ඌව පළාත් සභා මුද්‍රණාල අත්තිකාරම් ගිණුම් කටයුත්ත

| | | |
|---|---|---|
| ඌව පළාත් සභා මුදල් රීති 503.4 අනුව අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් නියමිත සීමාවන් ඇතුළත කටයුතු කළයුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ මුදල් ප්‍රකාශනය අනුව ඌව පළාත් සභා මුද්‍රණාල අත්තිකාරම් ගිණුමට අදාළ වියදමේ උපරිම සීමාව රු.25,000,000 ක් වුවද, සත්‍ය වියදම රු. 26,039,800 ක් වූයෙන් රු. 1,039,800 කින් වියදමේ උපරිම සීමාව ඉක්මවා තිබුණි. | කොවිඩ් 19 හේතුවෙන් ගොඩගැසී තිබුණු මුද්‍රණ කටයුතු ඉතා ඉක්මනින් ඉටුකර භාරදීම සඳහා සිදු කළ මුද්‍රණ කටයුතු කාර්යයේදී වියදම උපරිම සීමාව ඉක්මවා තිබුණි. | අවශ්‍ය අවස්ථාවන්හිදී සීමා සංශෝධනය කරවා ගැනීම. |

(ඇ) පළාත් සහා අනෙකුත් කාර්ය මණ්ඩල පරිපාලනය

| | | |
|---|---|---|
| 2000 අංක 05 දරන ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ 6 සහ 7 වගන්ති ප්‍රකාරව පුස්තකාල සේවා මණ්ඩලය සඳහා අවශ්‍ය නිලධාරීන් ඇතුළු කාර්ය මණ්ඩලය එම මණ්ඩලය විසින් බඳවා නොගෙන ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් වැටුප් ලබන නිලධාරීන් හා සේවකයන් 27 දෙනෙකු අනුයුක්ත කර සේවයේ යොදවා ගෙන තිබුණි. | මේ වන විට ප්‍රඥප්තියේ 6 (අ)(II) සහ 7 (I) වගන්ති අනුව අධ්‍යක්ෂ වරයකු පත් කර ඇති අතර සෙසු තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට බඳවා ගැනීම් පරිපාටි සකස් කර අනුමැතිය සඳහා යොමු කර ඇත.<br><br>එසේම ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා කාර්ය මණ්ඩල අනුමත කරනුයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් බැවින් 2019 වර්ෂයේ ඒ සඳහා ඉල්ලීම් කර ඇතත් මෙතෙක් ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් අනුමත කර නොමැති බැවින් එම ආයතන සඳහා නව කාර්ය මණ්ඩල බඳවා ගන්නා තෙක් මෙසේ තාවකාලිකව අනුයුක්ත කිරීම් සිදු කර ඇත. | 2000 අංක 05 දරන ඌව පළාතේ පුස්තකාල සේවා මණ්ඩල ප්‍රඥප්තියේ 6 සහ 7 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 1.5.3 ශීර්ෂය-705 - **ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ පේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය**

(අ) කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඌව පළාත් ක්‍රීඩා, යෞවන කටයුතු,සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික, පේෂකර්මාන්ත හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය විසින් 2013 වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන ලද උඩවලව සංචාරක විවේකාංගණය සඳහා 2018 වර්ෂය වන විට රු.39,824,944 ක වියදමක් දරා තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද විවේකාංගණය හා කඩකාමර සංචාරකයින් සඳහා විවෘත කර නොතිබීමෙන් වැය කළ මුදලට සරිලන පරිදි ආදායම් උපදවා ගැනීමට අපොහොසත්ව තිබුණි. | උඩවලව සංචාරක මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ඉවත්කළ කඩකාමර වෙනුවෙන් ඉදිකළ නව කඩ කාමර 11 ක් 2020 ජනවාරි 23 දින බදු පදනම මත කඩ හිමියන්ට ලබා දී ඇති නමුත් කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් ව්‍යාපාර පවත්වාගෙන යාමට බාධා වී ඇත. | විවේකාංගණය හා කඩකාමර සංචාරකයින් සඳහා කඩිනමින් විවෘත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | මධ්‍යස්ථානයේ ආපන ශාලාව හා කඩකාමර බදු දීම සඳහා ටෙන්ඩර් පරිපාටිය අනුගමනය කර ගැණුම්කරුවන් හඳුනා ගත්තද රටතුළ පැවති කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් එම ගැණුම්කරුවන් ගිවිසුම් ගතවීමට ඉදිරිපත් නොවුණි.<br>මධ්‍යම රජයේ ප්‍රතිපාදන ලබාගෙන භූමි අලංකරණ හා ඉදිරි සංවර්ධන කටයුතු කඩිනමින් නිම කිරීමට සැලසුම් කර ඇත. | |
| (ii) | කිතුල්කොටේ සංචාරක පහසුකම් මධ්‍යස්ථානයේ මුළුතැන්ගෙය හා ආපනශාලාව රු.20,987,306 ක් වැයකර 2018 ජුලි 18 දින වන විටද, වැසිකිළි පද්ධතිය රු.6,029,215 ක් වැයකර 2018 මැයි 02 දින වන විටද වැඩ නිමකර තිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද ඒවා ප්‍රයෝජනයට ගෙන නොතිබීමෙන් වැය කළ මුදලට සරිලන පරිදි ආදායම් උපදවා ගැනීමට අපොහොසත්ව තිබුණි. | දූර ගමන් සේවා බස් රථ සඳහා පහසුකම් සපයනු ලබන මධ්‍යස්ථානයේ ගොඩනැගිලි බදු දීම සඳහා මිල ගණන් කැඳවූ පසු ඊට මිල ගණන් ඉදිරිපත් කළ සැපයුම්කරුවන් රට තුළ පැවති කොවිඩ් 19 ව්‍යසනය හේතුවෙන් ගිවිසුම් ගතවීමට ඉදිරිපත් නොවුණි. එබැවින් දේශීය සංචාරකයින් ඉලක්ක කර ගනිමින් මෙහි කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ හෙළ බොජුන් හලක් ස්ථාපනය කිරිමට සැලසුම් කර ඇති අතර ඒ සඳහා මධ්‍යම රජයේ කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇත. | කඩිනමින් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.4 ශීර්ෂය-706 - **කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කටයුතු අමාත්‍යාංශය**

(අ) බීජ අර්තාපල් ආනයනය කර බෙදාහැරීමේ විශේෂ අත්තිකාරම් ගිණුම් කටයුත්ත

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද අත්තිකාරම් ගිණුමේ දැක්වෙන රු.24,906,660 ක අලාභය පියවීම සඳහා ඌව පළාත් සභා මුදල් රීති 511 අනුව අදාළ කටයුතු කර නොතිබුණි. | අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | මුදල් රීති 511 අනුව කටයුතු කළ යුතුය. |
| (ii) | 2003 වර්ෂයේ දී ගොවීන් අතර බෙදා දී තිබූ ආනයනික බීජ අර්තාපල් වලට අදාළව සමාලෝචිත වර්ෂයේ ආරම්භයට ලැබිය යුතු ණය ශේෂය රු.10,509,070 ක් වූ අතර ඉන් වර්ෂය තුළ රු.197,151 ක් පමණක් අයකර ගෙන තිබුණි. ඒ අනුව ණය අයකරගැනීමේ ප්‍රගතිය සියයට 1.8 ක තරම් ඉතා පහළ මට්ටමක පැවැති අතර ණය පදනමට බීජ ලබාදී වසර 17 ක් ගතවී පැවතියද තවදුරටත් රු.10,311,919 ක් අයවිය යුතුව පැවතුනි. | ඇතැම් ණයගැතියන් මියයාම, විශ්‍රාම යාම හා ප්‍රදේශ හැරගොස් සිටීම හේතුවෙන් අයකර ගැනීම දුර්වල මට්ටමක පවතින බව හා අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | කඩිනමින් ණය අයකර ගත යුතුය. |
| (iii) | ආනයනය කරන ලද බීජ අර්තාපල් නරක්වීම හේතුවෙන් බීජ අර්තාපල් ආනයනය කළ සමාගමෙන් රු.4,893,741 ක් අයකර ගැනීමට කටයුතු කළයුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අයකර ගෙන නොතිබුණි. | “තෙත කුණුවීම” රෝගය මත රේගුව තුළදී ප්‍රතික්ෂේප වූ ආනයනය කරන ලද බීජ අර්තාපල් ලබාදෙන ලද සමාගමෙන් අයවිය යුතු අලාභය වන රු. 4,893,741 ක මුදල කඩිනමින් පියවන ලෙස දන්වමින් අදාළ සමාගම වෙත වරින් වර ලිපි යොමු කරන ලදී. එහෙත් මීට යහපත් ප්‍රතිචාරයක් එම සමාගම නොදැක් වූ හෙයින් මෙම ගැටළුව නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. | විධිමත් ගිවිසුමකට එළඹීමෙන් අනතුරුව ආනයනය කිරීමට කටයුතු නොකිරීම හා කඩිනමින්ම ජාත්‍යන්තර බේරුම්කරණයට නොයාම යන හේතුමත වගකීම පැහැරහැරි නිලධාරීන්ගෙන් අයකරගත යුතුය. |

1.5.5 ශීර්ෂය-709-නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු) කාර්යාලය

කාර්ය මණ්ඩල පරිපාලනය

(අ) අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

(i) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල
(පාසල් කාර්ය මණ්ඩලය හැර)

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 1453 | 1015 | 438 | - |
| (ii) | තෘතියික මට්ටම | 310 | 183 | 127 | - |
| (iii) | ද්විතික මට්ටම | 7848 | 6583 | 1265 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 5887 | 5075 | 812 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 720 | - | 720 |
| (vi) | ද්විතික මට්ටම (අනුමත නොවූ සංවර්ධන නිලධාරී) | - | 19 | - | 19 |
| | එකතුව | 15498 | 13595 | 2642 | 739 |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් සභාවේ අනුමත සේවක සංඛ්‍යාවට අමතරව සේවකයින් 739 දෙනෙකු විවිධ තනතුරු සඳහා අවිධිමත් ලෙස බඳවා ගෙන තිබුණි. | ද්විතික මට්ටමේ නිලධාරීන් 19 දෙනෙකු නැවත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීම සඳහා මගේ අංක 4/HRM/2 (පොදු) හා 2020 ජුනි 23 දිනැති ලිපිය මගින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් නැවත ඉල්ලීම් කරන ලදී. වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) මත වූ සේවකයින් 720 | අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ කාලීනව සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |

දෙනෙකු පිළිබඳ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදහස් දක්වා නැත.

(ii) පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පතිවරුන් | 1077 | 738 | 339 | - |
| (ii) | ගුරුභවතුන් | 16384 | 16490 | - | 106 |
| (iii) | සහය කාර්ය මණ්ඩලය | 2464 | 2653 | - | 189 |
| (iv) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 25 | - | 25 |
| (v) | ගුරුභවතුන් (අනුමත නොවූ) | - | 642 | - | 642 |
| (vi) | සහය කාර්ය මණ්ඩලය (අනුමත නොවූ) | - | 122 | - | 122 |
| | එකතුව | 19925 | 20670 | 339 | 1084 |

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඌව පළාත් සභාවේ පාසැල් කාර්ය මණ්ඩලය සඳහා අනුමත කාර්ය මණ්ඩලයට අතිරික්තව නිලධාරීන් 1084 දෙනෙකු අනුයුක්ත කර ගෙන තිබුණි. | 2017 කාර්ය මණ්ඩල සමාලෝචනයට පෙර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පාසල් කාර්ය මණ්ඩල තුළ අනුමත වී තිබුණු මෙම තනතුරු සංඛ්‍යාව,නව කාර්ය මණ්ඩල අනුමත කිරීමේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙතින් මගහැරී තිබූ බව නිරීක්ෂණය වූ අතර නැවත අනුමත | අනුමත සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු සඳහා සේවකයින් බඳවා ගැනීමට හෝ කාලීනව සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීමට පියවර ගත යුතුය. |

කර ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

1.5.6 ශීර්ෂය-710- **සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව**

(අ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 5,700,000 | සියලුම නිලධාරීන් විසින් පැමිණීම හා පිටවීම සලකුණු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළයුතු වුවද, ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී මිලදීගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 100 ක් අදාළ කාර්යය සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කිරීම සඳහා සියලුම සෞඛ්‍ය ආයතන වෙත යන්ත්‍ර සවි කළත් ඒ අතරින් ආයතන 37 ක කාර්යාලගත නිලධාරීන් පමණක් ඒවා භාවිතා කරයි. ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කරන ලෙස අවස්ථා ගණනාවකදී එම ආයතන දැනුවත් කළද සියලුම තනතුරුවලට අදාළ කාර්ය මණ්ඩල ඒවා භාවිතා නොකරන බැවින් වෘත්තීය සමිති දක්වන විරෝධතා මත ඌව පළාතේ අනෙකුත් රෝහල් හා සෞඛ්‍ය ආයතන මෙම යන්ත්‍ර භාවිතා නොකරයි. | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

(ආ) කළමනාකරණ අකාර්යක්ෂමතා

| | | |
|---|---|---|
| හපුතලේ දිසා රෝහලට ජලය ලබාගන්නා ස්වභාවික ජල උල්පතෙහි ජලයට සත්ත්ව මල එකතුවීම හේතුවෙන් පානය සඳහා නුසුදුසු බව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින් තහවුරු කර ඇති බැවින් හා වියළි කාලයේදී එම ජල මූලාශ්‍රය සිඳීයන බැවින් රෝහලට අත්‍යාවශ්‍ය පානීය ජලය සැපයීමේ විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කර නොතිබුණු බව නිරීක්ෂණය කෙරේ. | හපුතලේ ප්‍රාදේශීය රෝහලේ ජල ගැටළුව විසඳීම සඳහා 2021 සැලැස්මට ඇතුළත් කර ඇත. | ප්‍රමුඛතාවය දියයුතු කරුණක් සේ සලකා ගැටළුව විසඳීම සඳහා පියවර ගත යුතුය. |

1.5.7 ශීර්ෂය -711 - අධ්‍යාපන දෙපාර්තමේන්තුව

(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013 ජුලි මස 03 දින සිට වසා දමන ලද කන්දේපුහුල්පොල බ/ධර්මාරාම විද්‍යාලයේ ගොඩනැගිල්ල හා ඉඩම 2014 සැප්තැම්බර් 24 දින සිට වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට භාරදී තිබුණ ද සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් 18 දින වන විටද කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් : මෙම ඉඩම හා ගොඩනැගිල්ල බීජ අල නිෂ්පාදනාගාරයක්, ගබඩාවක් සහ රසායනාගාරයක් පවත්වාගෙන යාම සඳහා ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පවරා දෙන මෙන් 2020 දෙසැම්බර් 07 දින ඉල්ලීමක් කර ඇති අතර ඒ අනුව එම පවරා දීමට අදාළ ලිපි ලේඛන මාගේ නිර්දේශ සහිතව ඌව පළාත් ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුවට 2020 දෙසැම්බර් 11 දින යොමු කර ඇත. ඒ අනුව එම පවරාදීමේ කටයුතු මේ වන විට සිදු වෙමින් පවතී. | මෙම නිෂ්කාර්ය වත්කම් කඩිනමින් ඵලදායී කටයුත්තක් සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.8 ශීර්ෂය-715- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

(අ) බොරලන්ද සත්ත්ව ගොවිපොළ වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්ත

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොගය ගණනය කිරීමේදී සතුන්ගේ වටිනාකම තක්සේරු කිරීම සඳහා පත්කළ කමිටු වාර්තාව අනුව, මී හරකෙකුගේ බර කිලෝග්රෑම් 01 කට රු. 300 බැගින් ගණනය කළ යුතු වුවද, රු. 200 බැගින් ගණනය කිරීම නිසා මී ගවයින් 87 දෙනෙකුට අදාළ බර කිලෝග්‍රෑම් 28,475 ක් සඳහා වටිනාකම රු.2,847,500 ක් අඩුවෙන් ගණනය කර තිබුණි. එසේම මී ගවයින් තිදෙනෙකුගේ වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා තොග වටිනාකම රු.109,800 කින් අඩුවෙන්ද දක්වා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අතැති තොගය රු.2,957,300 ක් අඩුවෙන් හා වර්ෂයේ මෙහෙයුම් අලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්වේ. | සමාලෝචිත වර්ෂයේ තොග ගණනය කිරීමේදී මී ගවයින්ගේ වටිනාකම රු. 100 ක් අඩුවෙන් තක්සේරු කිරීම නිසා අවසාන තොගය රු.2,847,500 කින් අඩුවීමේ වරද 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාණිජ අත්තිකාරම් ගිණුම් සැකසීමේදී වැරදි නිවැරදි කිරීමේ ජර්නල් සටහනක් මගින් ආරම්භක තොග ශේෂය සංශෝධනය කර නිවැරදි කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන සහ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ගොවිපොළට ලබාදී තිබුණු රු.1,398,360 ක වත්කම් විෂයයන් 05 ක වටිනාකම ගිණුම්ගත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම් සහ ප්‍රාග්ධනය රු.1,398,360 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වේ. | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම්ගත කිරීමට නොහැකි වී තිබූ රු.1,398,360 ක වත්කම් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වාණිජ අත්තිකාරම් ගිණුම් සැකසීමේදී ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව කාරුණිකව දන්වා සිටිමි. | නිවැරදි වටිනාකම ගිණුම් ගත කළ යුතුය. |
| (iii) | ඌව පළාත් සභා මුදල් රීති 503.4 ට අනුව අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් නියමිත සීමාවන් ඇතුළත කටයුතු කළ යුතු වුවද, සත්ත්ව ගොවිපොළේ 2020 වාණිජ අත්තිකාරම් ගිණුමෙහි උපරිම හර ශේෂ සීමාව | සතුන්ගේ ජීව බර අඩුවැඩි වන බැවින් වටිනාකම තක්සේරු කිරීම ප්‍රායෝගිකව අපහසු බැවින් 2020 සීමා | අවශ්‍ය අවස්ථාවන්හිදී සීමා සංශෝධනය කරවා ගත |

| | | | |
|---|---|---|---|
| | රු.20,000,000 ක් හා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් ශේෂය රු.38,026,314 ක් වුයෙන් රු.18,026,314 කින් උපරිම හර ශේෂ සීමාව ඉක්මවා තිබුණි. | සංශෝධනයේදී උපරිම හර ශේෂ සංශෝධනය කර නොමැති බවත්, ඉදිරියේදී එම සීමාව සංශෝධනය කර දෙන ලෙස නියෝජ්‍ය ප්‍රධාන ලේකම් වෙත දන්වා ඇත. | යුතුය. |
| (iv) | ඌව පළාත් සභා මුදල් රීති 509 ට අනුව ස්ථාවර වත්කම් ක්ෂය කර ඊට අදාළ මුදල පළාත් භාණ්ඩාගාරයේ "පොදු තැන්පත් ගිණුම - ක්ෂය සංචිත අරමුදල" බැර කළ යුතු වුවද සමාලෝචිත වර්ෂයේ ක්ෂය කළ වටිනාකම වූ රු.4,023,662 ක් පළාත් භාණ්ඩාගාරයට යවා හෝ සංචිත ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | පුනරාවර්තන වියදම් දැරීම සඳහා ප්‍රමාණවත් කාරක ප්‍රාග්ධනයක් ගොවිපොළ සතුව තිබිය යුතු බැවින් ක්ෂය ප්‍රමාණය සංචිත අරමුදල වෙත බැරකර නොමැත. | මුදල් රීති 509 ට අනුව කටයුතු කළ යුතුය. |

1.5.9 ශීර්ෂය-716 -ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව

ආදායම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් වාණිජ පදනමින් දීර්ඝකාලීනව ඉඩම් බදු දී තිබුණු ඉඩම් වෙනුවෙන් බදුකරුවන් 06 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවට අයවිය යුතු රු. 22,421,720 ක් අයකර ගෙන නොතිබුණි. | මෙම හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා නව ලිපි ගොනු සකස් කර බදුකරුවන්ට එරෙහිව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීම වෙනුවෙන් උපදෙස් ලබා ගැනීම සඳහා එම විස්තර ඉඩම් කොමසාරිස් ජනරාල් වෙත යොමු කර ඇත. | බදු ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

1.5.10 ශීර්ෂය-717 වාර්මාර්ග දෙපාර්තමේන්තුව

-------------------------------------------

(අ) අත්හැර දැමූ ව්‍යාපෘති

-----------------------

විගණන නිරීක්ෂණය

| ---------------------- | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම<br>--------------------- | නිර්දේශය<br>------------- |
|---|---|---|
| මොනරාගල දිස්ත්‍රික් ලේකම් විසින් ලබාදී තිබුණු මූල්‍ය ප්‍රතිපාදන අනුව රු. 4,916,581 ක් වැය කර සියඹලාණ්ඩුව කරම්මඩ වැවේ පිටවාන ඉදිකිරීමේදී එය නියමිත උසට වඩා අඩු උසකින් ඉදිකිරීම නිසා වැවේ ජලය ප්‍රමාණවත් පරිදි නොරැඳී වල් බිහිවී එම වියදම නිශ්කාර්ය වියදමක් බවට පත්ව තිබුණු අතර, ව්‍යාපෘති යෝජනාව අනුව වූ ගොවි පවුල් 20 මගින් කුඹුරු අක්කර 50 ක් පමණ වගාකරවීමේ අරමුණු ඉටුකර ගත නොහැකි වී තිබුණි. | මෙහිදී කැඩී ගොස්තිබූ වැව් බැම්ම සකස්කළ අතර පිටවානක් නොතිබූ බැවින් කොන්ක්‍රීට් යොදා පිටවානක් සකස්කර ඇත. වැව් බැමමේ මට්ටම ගැනීමේදී එයට ඉහළින් ඇති මාර්ගය යට නොවන පරිදි උස සීමා කර, ඊට අනුව පිටවානේ උසද තීරණය කර ඉදිකිරීම් කර ඇත.<br><br>වැව පිරීම සඳහා වර්ෂා ජලය පමණක් භාවිතා වන බැවින් ආර්ථික භෝග වගා කිරීම වඩාත් යෝග්‍ය වේ. මේ වන විටත් බඩ ඉරිඟු, උක් ආදී භෝග වගා කරන බැවින් මෙය නිශ්කාර්ය වියදමක් නොවේ.<br><br>වැව ඇතුළත පස් වෙනත් සංවර්ධන කටයුතු වලට යොදා ගැනීමෙන් වැවේ ධාරිතාවය වැඩිකර ගත හැකි බව ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇති අතර ප්‍රමාණවත් තරම් පළලටපිටවාන ඉදිකර ඇති බැවින් වර්ෂාව අධ්‍යයනය කර මාර්ගය යට නොවන පරිදි පිටවාන තවත් අඩියක් එසවීමට ඉදිරියේදී කටයුතු කරමි. | පූර්ව අධ්‍යයනයක් සිදුකර එහි ප්‍රතිඵල මත කර්මාන්ත ඉටුකළ යුතුය. |

1.5.11 ශීර්ෂය- 718 - කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්ත

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු රු.16,013,745 ක ජංගම නොවන වත්කම් ශේෂය සනාථ කිරීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය හා වටිනාකම් සහිත උපලේඛන විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී පිළියෙල කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කළ යුතුය. |
| (ii) | ඌව පළාත් සභා මුදල් රීති 503.4 අනුව අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් නියමිත සීමාවන් ඇතුළත කටයුතු කළයුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ පේෂකර්ම වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළ උපරිම හර ශේෂ සීමාව රු.63,562,800 ක් වුවද දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජංගම වත්කම් රු.76,551,078 ක් වුයෙන් රු.12,988,278 කින් උපරිම හර ශේෂ සීමාව ඉක්මවා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බව කාරුණිකව සඳහන් කරමි. | නියමිත සීමාවන් තුළ කටයුතු කිරීමට පියවර ගත යුතු අතර එසේ කළ නොහැකි නම් සීමා සංශෝධනය කරවා ගත යුතුය. |
| (iii) | ඌව පළාත් සභා මුදල් රීති 510.2 අනුව අත්තිකාරම් ගිණුම් කටයුතු වලින් උත්පාදනය වන ලාභ පළාත් සභා අරමුදලට බැර කළයුතු වුවද, සමාලෝචිත වර්ෂයේ රු.4,333,571 ක ලාභය පළාත් සභා අරමුදලට බැර කර නොතිබුණි. | 2021 වර්ෂයේදී ප්‍රේෂණය කිරීමට කටයුතු කරන බව කාරුණිකව දක්වා සිටිමි. | මුදල් රීති 510.2 ට අනුව කටයුතු කළ යුතුය. |
| (iv) | 1991 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ණයට විකුණු රෙදිපිළි වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රජයේ ආයතන 799 කට අයත් නිලධාරීන්ගෙන් අයවිය යුතු රු.3,138,410 ක් අය කර නොතිබුණි. | කඩිනමින් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. | කඩිනමින් ණය අයකර ගැනීමට පියවර ගත යුතුය. |

(ආ) ලුහු ඉංජිනේරු වාණිජ අත්තිකාරම් ගිණුම් කටයුත්ත

| | | | |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.1,634,484 ක ජංගම නොවන වත්කම් සහ රු.585,115 ක ලැබිය යුතු විකුණුම් ආදායම් සනාථ කර ගැනීම සඳහා ස්ථාවර වත්කම් ලේඛනය, වටිනාකම් සහිත උපලේඛන, ශේෂ සනාථ කිරීම් හා කාල විශ්ලේෂණ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදී පිළියෙල කිරීමට කටයුතු කරන බව කාරුණිකව සඳහන් කරමි. | ස්ථාවර වත්කම් ලේඛන ණයගැතියන් සම්බන්ධ ලේඛන පවත්වාගෙන යා යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ඌව පළාත් සභා මුදල් රීති 503.4 අනුව අත්තිකාරම් ගිණුම් කටයුතු සම්බන්ධයෙන් නියමිත සීමාවන් ඇතුළත කටයුතු කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ ලුහු ඉංජිනේරු වාණිජ අත්තිකාරම් ගිණුමට අදාළ උපරිම හර ශේෂ සීමාව රු.2,200,000 ක් වුවද දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජංගම වත්කම් රු.2,606,726 ක් වුයෙන් රු.406,726 කින් උපරිම හර ශේෂ සීමාව ඉක්මවා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බව කාරුණිකව සඳහන් කරමි. | මුදල් රීති 503.4 අනුව කටයුතු කළ යුතුය. |
| (iii) | සමාලෝචිත වර්ෂයේ උපරිම බැරකම් සීමාව රු.50,000 ක් වුවද දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව බැරකම් රු.545,400 ක් වුයෙන් රු.495,400 කින් උපරිම බැරකම් සීමාව ඉක්මවා තිබුණි. | ඉදිරියේදී නිවැරදි කිරීමට සටහන් කරගත් බව කාරුණිකව සඳහන් කරමි. | මුදල් රීති 503.4 අනුව කටයුතු කළ යුතුය. |

1.5.12 ශීර්ෂය- 721 - ආයුර්වේද දෙපාර්තමේන්තුව

(අ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | 848,891 | සියලුම නිලධාරීන් විසින් පැමිණීම හා පිටවීම සලකුණු කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කළයුතු වුවද, ඌව පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව 2017 වර්ෂයේදී මිලදී ගෙන තිබුණු ඇඟිලි සලකුණු යන්ත්‍ර 31 ක් අදාළ කාර්යය සඳහා 2020 දෙසැම්බර් 31 දින දක්වා භාවිතයට ගෙන නොතිබුණි. | ආයුර්වේදකොමසාරිස් කාර්යාලය සහ දියතලාව ආයුර්වේද රෝහලේ සේවකයින් හැර ආයතන 31 සෞඛ්‍ය සේවකයින් වෘත්තීය හේතු මත ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා නොකරයි. | චක්‍රලේඛයට අනුව කටයුතු කළ යුතුය. |

1.5.13 ශීර්ෂය- 722 - පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව

(අ) පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඌව පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට අයත් බිබිල, සෙවන ළමා සංවර්ධන මධ්‍යස්ථාන පරිශ්‍රයෙන් මුදාහරින අපජලය පිරිසිදු කිරීමකින් තොරව ප්‍රධාන මාර්ගයේ කාණුව හරහා බාහිර පරිසරයට යොමුකර තිබුණි. මෙම ක්‍රියාව නීති විරෝධී බව පෙන්වා දෙමින් යල්කුඹුර මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයා විසින්ද 2020 ජූලි 08 දින, 1939 අංක 61 සහ 1946 අංක 57 දරන පීඩන ක්‍රියා ආඥා පනත යටතේ නිවේදනයක් නිකුත් කර තිබුණු අතර එම නිවේදනයේ දින සිට දින 60 ක් ඇතුළත විධිමත් උරාගැනීමේ වළකට අප ජලය යොමු කළයුතු බව දක්වා තිබුණි. එහෙත් 2021 මාර්තු වන විටද මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මේ වන විට අපජලය විධිමත්ව බැහැර කිරීමට අවශ්‍යා දිය උරන වලක් සකස් කිරීමට අවශ්‍යා ඇස්තමේන්තු ලබාදෙන ලෙස පළාත් ගොඩනැගිලි අධ්‍යක්ෂ හා බිබිල ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා ඇති අතර ඒ අනුව අදාළ මිනුම් කටයුතු සිදුකරමින් පවතී. | අපජලය බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් ස්ථාපිත කළ යුතුය. |

1.5.14 ශීර්ෂය- 726 නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු සේවා) කාර්යාලය

(අ) අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් උපයෝජනය කර ක්‍රියාත්මක කරන "සෞඛ්‍ය පද්ධතිය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ" පළමු වටයේ ව්‍යාපෘති 10 ක් සඳහා ඌව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ලැබී තිබුණු රු.3,544,205 ක ඉංජිනේරුමය යෙදවුම් සඳහා උපදේශන ගාස්තු ඌව පළාත් සභා මුදල් රීති 2.1 අනුව පළාත් සභා අරමුදලට බැර කර නොතිබුණි. එමෙන්ම එම මුදලින් රාජ්‍ය වියදම් කළමනාකරණය සහ මූල්‍ය විනය පවත්වාගෙන යාම පිළිබඳ 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රු.2,862,340 ක් භාවිතා කර රු. 2,290,750 ක ජංගම දුරකථන සහ රු. 571,590 කට කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ඌව පළාත් මුදල් රීති 2.1 අනුව කටයුතු කළ යුතුය. |

(ආ) ඌව පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ කාර්යාලය සඳහා අත්තිකාරම් ගිණුම් කටයුත්ත

| | | |
|---|---|---|
| 2008 වසරේ සිට 2015 වසර දක්වා පළාත් සභාවට අයත් ආයතනවලින් අයවිය යුතුව තිබුණු එකතුව රු. 13,307,238 ක් අයනොකර සමුච්චිත අරමුදලට ගලපා තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ඌව පළාත් මුදල් රීති 113.5 අනුව කටයුතු කළ යුතුය. |

1.5.15 ශීර්ෂය-731- මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව

(අ) කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශගුණික අවබලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වටිනාකම රු. 58,815,876 ක් වූ කි.මී. 2.4ක් දිග සෙල්ලකතරගම-කිරිවෙහෙර මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබුණි. ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධ ප්‍රමාණ පත්‍රයේ විෂයය අංක 1.6 අනුව මාර්ගයට මිලි මීටර් 150 ක් ඝනකමක කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද, මාර්ගය ආරම්භක ස්ථානයේ සිට මීටර් 300 ක් දිගට යොදා ඇති කොන්ක්‍රීට් ස්ථරයේ ඝණකම මිලි මීටර් 120 ක් විය. එමෙන්ම ප්‍රමාණ පත්‍රයේ විෂයය අංක 1.7 අනුව දිග අතට හා හරස් අතට මිලි මීටර් 250 ක පරතරයක් පවතින ලෙස දඟර වානේ ඇතිරීම සිදුකළ යුතු වුවද, ස්ථාන 10 ක සිදුකළ නියැදි පරීක්ෂාවේදී දිග අතට මිලි මීටර් 260 සිට 280 දක්වා වූ පරතරයටත් හරස් අතට මිලි මීටර් 255 සිට 280 දක්වා වූ පරතරයටත් දඟර වානේ යොදා තිබුණි. | ප්‍රමාණ පත්‍රයේ විෂයය අංක 1.6 අනුව මාර්ගයට මිලි මීටර් 150 ක් ඝනකමක කොන්ක්‍රීට් යෙදිය යුතු වුවද රසායනාගාර පරීක්ෂාව තුළින් ලබාගන්නා ලද සත්‍ය මිනුම් අනුව ගෙවීම් කිරීම සඳහා වාර්තාවක් සකස් කර ඉදිරිපත් කර ඇත. ඒ අනුව ඇස්තමේන්තු ගත ප්‍රමාණයට වඩා කොන්ක්‍රීට් ඝන මීටර් 6.15 ක් අඩුකර ගෙවීම් නිර්දේශ කර ඇත.<br><br>ප්‍රමාණ පත්‍රයේ විෂයය අංක 1.7 යටතේ ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වූයේ කම්බි බැඳීමේදී කම්බි ගණන නිවැරදි වුවද, නිසි අයුරින් ගැටගසා නොමැතිවීම හේතුවෙන් මිනුම් වෙනස් වන බවකි. ඒ අනුව ඊට අදාළ උපදෙස් ලබාදී නිවැරදි කරන ලදී. මේ සඳහා ගෙවීම් කිරීමේදී රජයට අලාභයක් සිදුවී නැත. | පිරිවිතරයන්ගෙන් බැහැරවීම් නිවැරදි කිරීමත්, වරද අනාවරණය කර ගැනීමට අපොහොසත් වූ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයන් පැවැත්වීමත් සිදු කළ යුතුය. |

(ආ) ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු රු. මිලියන 956.7 ක ප්‍රතිපාදන උපයෝජනය කර ඌව පළාත් මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කර තිබුණු ග්‍රාමීය පාලම් ව්‍යාපෘතියේ ඉදිකිරීම් සම්බන්ධයෙන් කරන ලද නියැදි විගණන පරීක්ෂාවේදී රු. මිලියන 153 ක් වැයකර ඉදිකර තිබුණු පාලම් 05 ක් සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| | | | |
|---|---|---|---|
| (i) | බදුල්ල දිස්ත්‍රික්කයේ බණ්ඩාරවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ රු.මිලියන 32.8 ක වියදමක් දරා ඉදිකර තිබුණු අංක 1125 දරන ගල්කන්දවත්ත පාලම ඉදිකිරීමේ අක්‍රමවත් බව සහ ඊට සම්බන්ධවන මාර්ගය ඉදිකිරීමේ අක්‍රමවත් බව නිසා පාලම භාවිතයට ගැනීමට නොහැකි වී තිබුණි. | පාලම ඉදිකළ යුතු ස්ථානයේ පැවති භෞතික ස්වභාවය අනුව පාලම මාර්ගයට ගැලපෙන ආකාරයේ උසකින් සකස් කිරීම සඳහා වෙන් වී තිබූ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැත. මෙම මාර්ගය ඉදිරියේදී සංවර්ධනය කිරීමේදී නියමිත බෑවුම සකස්කර කොන්ක්‍රීට් මාර්ගයක් ලෙස සකස් කිරීමෙන් මෙම තත්ත්වය නිරාකරණය කරගත හැක. මෙම පිළිසකර කිරීම් මාර්ගය අයත්වන ආයතනයෙන් සිදු කිරීම අත්‍යාවශ්‍ය බව සඳහන් කරමි. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |
| (ii) | බදුල්ල දිස්ත්‍රික්කයේ හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුරුකුදේගම රු. මිලියන 25.5 ක් වැය කර ඉදිකර තිබුණු අංක 2243 දරන කුරුකුදේගම-බඳුවත්ත පාලමට කුරුකුදේගම සිට එන ප්‍රවේශ මාර්ගය පුළුල් කර සම්බන්ධ කර නොතිබුණු බැවින් වාහන ගමනා ගමනය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | කුරුකුදේගම ප්‍රවේශ මාර්ගය යා කරන මාර්ගය පාලම ඉදිකරන අවස්ථාවේ නාය යාමට ලක්ව තිබූ අතර ප්‍රදේශ වාසීන්ගේ ඉල්ලීම මත මෙම පාලම ඉදිකර ඇත. පාලම ඉදිකරන අවස්ථාවේ මාර්ගය දෙපසින්ම ප්‍රවාහන පහසුකම් සලසා තිබුණි. අදාල ප්‍රාදේශීය සභාව මෙම මාර්ගය පුළුල්කර සකස්කර ගත යුතුය. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බල්ලේකෙටුව නාවලගම ග්‍රාමයේ රු. මිලියන 33.4 ක් වැය කර ඉදිකර තිබුණු අංක 1843 දරන උඩුතුරේ පිටපොල පාලමේ දකුණු පසට මාර්ගය සකසා නොතිබුණු බැවින් වාහන ගමනා ගමනය සඳහා යොදා ගැනීමට නොහැකි වී තිබුණි. | පාලමේ වම් පස කෙළවරට මාර්ගය පිහිටා ඇති අතර අප විසින් මීටර් 16 ක් දිගට මාර්ගය ඉදිකර ඇති නමුත් තවත් මීටර් 40 ක් දිගට මාර්ගය සකස්කළ යුතුව ඇත. ඒ අනුව මාර්ගයට පාලම සම්බන්ධ වී ඇත.<br><br>වාහන සඳහා ප්‍රවේශ පහසුකම් සැලසීමට නොහැකි වී ඇතැයි යන්නට එකඟ විය නොහැක. පාලම ඉදිකර අදාල ප්‍රාදේශීය සභාව වෙත භාර දී ඇති අතර පාලමේ උපරිම ප්‍රයෝජන ලබාගැනීමට නම් ප්‍රාදේශීය සභාව මීටර් 40 ක් දිගට මාර්ගය සකස්කළ යුතුව ඇත. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය.<br>පාලම් ඉදිකිරීමට පෙර මාර්ගය සංවර්ධනය කර පාලම උපයෝජනය කරන බවට අදාළ ප්‍රාදේශීය සභාවෙන් එකඟතාවය ලබාගත යුතුය. |
| (iv) | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කුඹල්වෙල ග්‍රාමයේ රු. මිලියන 33.2 ක් වැය කර ඉදිකර තිබුණු අංක 1130 දරන හෙට්ටිපොලවත්ත පාලමේ වම්පස බදුල්ල-බණ්ඩාරවෙල ප්‍රධාන මාර්ගයට සම්බන්ධ කර දකුණුපස මාර්ගයක් නොමැති තේ වත්තකට සම්බන්ධ කර, වාහන ගමනා ගමනය සඳහා යොදා ගැනීමට අවකාශයක් නොමැතිසේ ඉදිකර තිබුණි. | වාහන ගමනා ගමනයට සුදුසු මාර්ගයක් පාලමට සම්බන්ධ කර ගැනීමට අවකාශයක් නොමැති ස්ථානයක මෙම පාලම ඉදිකර ඇතැයි යන්න නිවැරදි නොවේ. මෙම ස්ථානයේ අඩි පාලමක් තිබුණද ප්‍රදේශ වාසීන්ගේ ඉල්ලීම මත මෙම පාලම ඉදිකර ඇත.<br><br>පාලමේ දකුණුපස කෙළවර මීටර් 30 ක පමණ කොටසක් පුද්ගලික ඉඩමක් හරහා මාර්ගය සම්බන්ධ කළ යුතු බැවින් ඉදිරි කටයුතු සිදු කිරීමට ප්‍රාදේශීය සභාව දැනුවත් කර ඇත. එබැවින් එය නිෂ්කාර්ය වියදමක් නොවේ. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (v) | බදුල්ල දිස්ත්‍රික්කයේ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ යහලඅරාව ග්‍රාමයේ රු. මිලියන 28.2 ක් වැය කර ඉදිකර තිබුණු අංක 1844 දරන ගල්තැන්නහේන වැලිඅරාව පාලමේ දකුණු පස කුඹුරකට සම්බන්ධ කර තිබීම සහ ඒ හේතුවෙන් පාලමට විධිමත්ව ප්‍රවේශ මාර්ගයක් සම්බන්ධ වී නොතිබීම හේතුවෙන් වැය කර තිබූ මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. | විගණන නිරීක්ෂණය සත්‍ය වේ. මෙය පාලමේ දකුණු පස මාර්ගයට සම්බන්ධවන කොටස වන අතර එය නාවලගම පුරාණ රජමහා විහාරය හා රාවණා ඇල්ල පුරාණ රජමහා විහාරය සතු කුඹුරු ඉඩමකි.<br><br>අදාල විහාරාධිපති ස්වාමීන් වහන්සේ විසින් මෙම මාර්ග කොටස ඉදිකිරීමට ඉඩම ලබාදීමට කැමැත්ත ප්‍රකාශ කර ඇති අතර ප්‍රාදේශීය සභාව ඉදිරි කටයුතු සිදුකළ යුතුය. එබැවින් එය නිෂ්කාර්ය වියදමක් නොවේ. | සැලසුම්වල හෝ ඇස්තමේන්තු කිරීමේ දෝෂයක් වේනම් එයට සම්බන්ධ නිලධාරීන් සම්බන්ධයෙන් පරීක්ෂණයක් පැවැත්විය යුතුය. නොපමාව පාලම භාවිතයට ගැනීම සඳහා පියවර ගත යුතුය. |

1.5.16 ශීර්ෂය -736- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මූල්‍ය කළමනාකරණ) කාර්යාලය
------------------------------------------------------------------------------

(අ) නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම
--------------------------------------------------------------------

| **නීති,රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2019 දරන අයවැය චක්‍රලේඛය 4 ජේදය** | **රු. 50,389,479** | **සමාලෝචිත වර්ෂයේ කාර්යාලයීය උපකරණ මිලදී ගැනීම නොකළ යුතු බවට උපදෙස් දී තිබුණද, ලී බඩු හා කාර්යාල උපකරණ මිලදී ගෙන තිබුණි.** | මෙම චක්‍රලේඛය 2019 වර්ෂයේ අයවැයට අදාල වේ. මෙම වියදම් සෑම ආයතනයකම ආයතනික කටයුතු පවත්වාගෙන යාම සඳහා දරා ඇත. මෙම ක්‍රලේඛයෙන් උපදෙස් දී ඇත්තේ නව වැඩ ආරම්භ නොකරන ලෙසට වන අතර ඉන් අදහස් වන්නේ නව හඳුනාගැනීම් හා ව්‍යාපෘතීන් ආරම්භ නොකරන ලෙසය. | 2019 දෙසැම්බර් 31 දිනැති අංක 09/2019 අයවැය චක්‍රලේඛයේ 5.3 මගින් අංක 07/2019 දරන චක්‍රලේඛ විධිවිධාන ඉදිරියටත් වලංගු කර ඇති බැවින් එම විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

කාර්යාලයේ උපකරණ ක්‍රියාත්මක කිරීමට නොහැකිවූ අවස්ථාවකදී හා පවත්නා කටයුතු සක්‍රීයව පවත්වාගෙන යෑම හා වත්කම් ප්‍රතිස්ථාපනය කිරීම මෙමඟින් සීමා කර නැත.

2. මූල්‍ය සමාලෝචනය
---------------------

(අ) මූල්‍ය ප්‍රතිඵලය
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 1,813,542,623 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 3,230,237,968 ක් විය.

(ආ) ආදායම් හා වියදම් විචලනය
------------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

ආදායම

| | 2020 | | | 2019 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පළාත් සභා විෂයයන්ට අදාළ ආදායම්** | | | | | | |
| බදු ආදායම | 1,708,220,000 | 1,531,152,211 | (177,067,789) | 4,877,230,000 | 3,199,744,392 | (1,677,485,608) |
| බදු නොවන ආදායම | 579,780,000 | 500,893,829 | (78,886,171) | 477,705,000 | 477,577,071 | (127,929) |
| රජයේ ප්‍රදාන | 25,476,441,742 | 25,476,441,742 | - | 23,138,000,000 | 21,249,500,000 | (1,888,500,000) |
| එකතුව | 27,764,441,742 | 27,508,487,782 | (255,953,960) | 28,492,935,000 | 24,926,821,463 | (3,566,113,537) |

**වියදම්**
**-------**
**පුනරාවර්තන වියදම්**
**----------------------**

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| පෞද්ගලික පඩිනඩි | 19,254,178,223 | 20,843,181,286 | (1,589,003,063) | 19,248,388,223 | 19,129,812,766 | 118,575,457 |
| අනෙකුත් | 4,480,933,777 | 4,166,992,029 | 313,941,748 | 4,480,933,777 | 5,036,621,893 | (555,688,116) |
| පුනරාවර්තන | ------------------ | ------------------ | ------------------ | ------------------ | ------------------ | ------------------ |
| උප එකතුව | 23,735,112,000 | 25,010,173,315 | (1,275,061,315) | 23,729,322,000 | 24,166,434,659 | (437,112,659) |
| රාජ්‍ය ආයෝජන | 1,942,498,447 | 657,555,271 | 1,284,943,176 | 4,472,728,157 | 967,863,593 | 3,504,864,564 |
| | ------------------ | ------------------ | ------------------ | ------------------ | ------------------ | ------------------ |
| එකතුව | 25,677,610,447 | 25,667,728,586 | (9,881,861) | 28,202,050,157 | 25,134,298,252 | 3,067,751,905 |
| | =========== | =========== | ========== | ========== | ========== | ========= |

**මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කෙරේ.**

| | | | |
|---|---|---|---|
| (i) | වර්ෂයේ මුළු වියදම වූ රු. 25,667,728,586 න් පුනරාවර්තන කටයුතු සඳහා දරන ලද වියදම රු. 25,010,173,315 ක්වූ අතර රු. 657,555,271 ක් හෙවත් මුළු වියදමෙන් සියයට 3 ක් පමණක් පළාත් සභා පළාත් සංවර්ධන කටයුතු සඳහා වැය කර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | පළාත් සංවර්ධන කටයුතු සඳහා වැඩිපුර අවධානයක් යොමුවිය යුතුය. |
| (ii) | වැය විෂය අංක 2401 කාර්ය මණ්ඩල පුහුණු මූලධන වැය විෂය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු. 42,711,718 ක් වූ අතර ඉන් රු. 26,277,541 ක් නොහොත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 62 ක් උපයෝජනය නොකර ඉතිරිකර තිබුණි. | අදහස් දක්වා නොතිබුණි. | ලබාගත් මුළු ප්‍රතිපාදනයම උපයෝජනය කළ යුතුය. |
| (iii) | 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 හා 2016 ජුලි 01 දිනැති අංක 03/2016(1) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව අතිකාල හා නිවාඩු දින වැටුප් ගෙවීම වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන්කරනු ලබන ප්‍රතිපාදන සීමාව තුළ කළමනාකරණය කරගත යුතුය. මෙසේ අතිකාල හා නිවාඩු දින වැටුප් වෙනුවෙන් වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් වෙන් කරන ලද රු. 1,709,493,500 ක ප්‍රතිපාදනයට අමතරව රු. 204,637,585 ක අතිරේක ප්‍රතිපාදන සලසාගෙන ඉන් රු. 1,913,073,657 ක් ඒ සඳහා වැය කර තිබුණි. එමෙන්ම ඉන් රු. 365,300 ක ප්‍රතිපාදන මුදල් රීති 66 යටතේ වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණු අතර අංක 1002 අතිකාල හා නිවාඩු දින වැටුප් වැය විෂයය සඳහා වර්ෂ අවසානයේ ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු. 172,988,482 ක බැරකම් සඳහා බැදීම් ඇතිකර ගෙන තිබුණි. | පළාත් සභාවට මුල් අවස්ථාවේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් මුදල් වෙන් කර දීම සිදු වුවද සත්‍ය අවශ්‍යතාවය ඊට වඩා වැඩි අගයක් ගනී. අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවාවක් උද්ඝෝෂණ වලින් තොරව පවත්වා ගෙන යාම සඳහා අමතර ප්‍රතිපාදන සලසා දීම සිදු කළ යුතු වේ. ප්‍රතිපාදන සීමාව ඉක්මවූ බැරකම් වලින් සියයට 95 ක් පමණ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැනි අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා දරන ලද වියදම් වේ. එම බැදීම් මුදල් රීති 94.2 යටතේ ඇති කරගෙන ඇත. | අනුමත ප්‍රතිපාදන සීමාව තුළ කටයුතු කළයුතු අතර අතිරේක ප්‍රතිපාදන සලසා ගැනීමට මුදල් රීති 66 යටතේ හා පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදසන සලසා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (iv) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ මුළු බැරකම් රු. 324,323,594 ක් වූ අතර පළාත් සභා මුදල් රීති 94.1 ට අනුකූල නොවන ලෙසට පුනරාවර්තන වැය විෂයයන් 09 ක් සහ මූලධන වැය විෂයයන් 02 ක් සඳහා වාර්ෂික ප්‍රතිපාදන සීමාව ඉක්මවා රු. 252,029,445 ක බැරකම් සඳහා බැඳීම් ඇතිකර ගෙන තිබුණි. | පළාත් සභාවට මුල් අවස්ථාවේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන සැලකිල්ලට ගනිමින් වාර්ෂික මුදල් ප්‍රකාශයෙන් මුදල් වෙන් කර දීම සිදු වුවද සත්‍ය අවශ්‍යතාවය ඊට වඩා වැඩි අගයක් ගනී. අත්‍යාවශ්‍ය සෞඛ්‍ය සේවාවක් උද්ඝෝෂණ වලින් තොරව පවත්වාගෙන යාම සඳහා අමතර ප්‍රතිපාදන සලසා දීම සිදු කළ යුතු වේ. ප්‍රතිපාදන සීමාව ඉක්මවූ බැරකම් වලින් සියයට 95 ක් පමණ සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වැනි අත්‍යාවශ්‍ය සේවා පවත්වාගෙන යාම සඳහා දරන ලද වියදම් වේ. එම බැඳීම් මුදල් රීති 94.2 යටතේ ඇති කරගෙන ඇත. | ප්‍රමුඛතා හඳුනාගෙන මනා සැලසුමකින් ඇස්තමේන්තු සකස් කළ යුතුය. |
| (ඇ) | කළමනාකරණ අකාර්යක්ෂමතා<br>---------------------------------- | | |
| (i) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් සහ පළාත් සභාවේ ආයතන 06 කින් ලැබිය යුතු අග්‍රිම රු. 25,340,185 ක් පියවාගෙන නොතිබුණි. | පළාත් භාණ්ඩාගාරය වෙත අග්‍රිම පියවීමට කටයුතු කරන ලෙස අදාළ ආයතන දැනුවත් කර ඇත. | වර්ෂය අවසානයට ඉතිරි අග්‍රිම ශේෂය පළාත් මුදල් රීති 366.5.2 ප්‍රකාරව ඊළඟ වර්ෂයේ ජනවාරි 10 දිනට හෝ පළාත් භාණ්ඩාගාරය නියම කරන දිනට පෙර පියවිය යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් කර වසර 02 ඉක්ම වූ ආයතන 27 කට අදාළ තැන්පතු ශේෂවල එකතුව රු.104,551,191 ක් මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 ප්‍රකාරව නියාදනය කර නොතිබුණි. | මු.රෙ 571 ප්‍රකාර අවශ්‍ය නියාදන කටයුතු කරන ලෙසට ආයතන දැනුවත් කර ඇති අතර ඒ අනුව ඉදිරියේදී කටයුතු සිදු කිරීමට නියමිතය. | කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ 571 ප්‍රකාරව කටයුතු කළයුතුය. |

| | | | |
|---|---|---|---|
| (iii) | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා කාර්යාල 29 කින් ස්ථාන මාරුවී ගිය, මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ සහ සේවය හැර ගිය නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. 85,217,140 ක වැටුප් ණය අයකර නොතිබුණි. | මෙම ණය ශේෂ පියවීමට සහ නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව නිරවුල් කළ යුතුය. |
| (iv) | ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඇතුළු විවිධ ආයතන 18 කට විවිධ ආයතන වලින් ස්ථාන මාරු වී පැමිණි නිලධාරීන්ගේ රු. 70,027,091 ක් වූ ණය ශේෂ නිරවුල් කර නොතිබුණි. | ණය ශේෂ පියවීමට හා නිරවුල් කිරීමට ඉදිරියේදී කටයුතු කෙරේ. | ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය, ඌව පළාත් මුදල් රීති 485(4) හා ඌව පළාත් ප්‍රධාන ලේකම්ගේ 2004 ජනවාරි 08 දිනැති අංක 2004/01 දරන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (v) | වර්ෂ 10 කට අධික කාලයක් පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන වල ජංගම වත්කම් වශයෙන් පෙන්වා තිබුණු රු. 40,566,157 ක අයවිය යුතු මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද අයකර නොතිබුණි. | බීජ අර්තාපල් ගිණුමෙන් නිලධාරීන්ගෙන් අය විය යුතු ශේෂ වෙනුවෙන් අදාළ ආයතන ප්‍රධානීන් දැනුවත්කර එම නිලධාරීන්ගෙන් අයකර ගැනීමට දන්වා ඇත. | ණය ශේෂය අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.17 ශීර්ෂය -737- නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ක්‍රමසම්පාදන) කාර්යාලය

(අ) පළාත් සංවර්ධන සැලැස්ම

සමාලෝචිත වර්ෂය සඳහා පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් ඇස්තමේන්තු අගය රු. මිලියන 2,236 ක ව්‍යාපෘති යෝජනා 1,485 ක් අනුමත කර තිබුණි. එම ව්‍යාපෘති යෝජනාවල ප්‍රගතිය පහත දැක්වේ.

| ව්‍යාපෘති වැඩ නිම කිරීම් පිළිබඳ විස්තර | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා |
|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිමකළ | 616 | 799 | 1415 |
| සියයට 50 ට වඩා වැඩියෙන් නිමකළ | 32 | 23 | 55 |
| සියයට 50 ට වඩා අඩුවෙන් නිමකළ | 9 | - | 9 |
| ආරම්භකර නොතිබුණු | 5 | 1 | 6 |
| එකතුව | 662 | 823 | 1,485 |

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ---------------------- | --------------------- | ------------- |
| (i) | ප්‍රාථමික සත්කාර සේවා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා රු. 93,300,000 කට ඇස්තමේන්තු කරන ලද කාර්යයන් 03 ක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ නොකර අතහැර දමා තිබුණි. | ව්‍යාපෘති සඳහා ඇස්තමේන්තු ගත පිරිවැය සම්පූර්ණයෙන්ම ලබා නොදීම හේතුවෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම මත කර්මාන්ත ආරම්භ කර නොමැත. | ව්‍යාපෘති ඇස්තමේන්තු පිළියෙල කිරීමට පෙර ප්‍රතිපාදන පිළිබඳව අවධානය යොමු කළ යුතුය. |
| (ii) | ඌව පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් බිබිල ගොවි පුහුණු මධ්‍යස්ථානය මගින් ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ-5) මට්ටමේ පාඨමාලා ආරම්භ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය සඳහා 2017 වර්ෂයේදී, ගොවීන්ගේ භාරකාර අරමුදලෙන් ලබාදුන් රු.10,000,000 ක ප්‍රතිපාදන යොදා ගෙන 2018 සැප්තැම්බර් වන විට සංවර්ධන කටයුතු සිදුකර තිබුණද, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටද අපේක්ෂිත අරමුණ වූ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ-5) මට්ටමේ පාඨමාලා ආරම්භ කර නොතිබුණි. | 2020 වර්ෂයේදී පාඨමාලා කටයුතු ආරම්භ කිරීමට සැලසුම්කර තිබුණද කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ආයතනික කටයුතු අඩපණ වීම හා වෙන් කළ ප්‍රතිපාදන නොලැබීම මත පාඨමාලා කටයුතු ආරම්භ කිරීමට නොහැකි විය.<br><br>2021 වර්ෂයේ පළාත් විෂය නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ප්‍රතිපාදන වෙන් කරගෙන ඇති අතර මෙම වර්ෂය තුළ පාඨමාලා කටයුතු ආරම්භ කිරීමට සියලු කටයුතු මේ වන විට සිදු කර ඇත. | අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

1.5.18 ශීර්ෂය -712- පළාත් පාලන දෙපාර්තමේන්තුව

(අ) හිඟ ආදායම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ---------------------- | --------------------- | ------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන අයකර ගතයුතු වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 725,530,590 ක් අයකර නොතිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා පළාත් පාලන ආයතන කටයුතු කළත් පසුගිය වර්ෂයේ | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | හා මෙම වර්ෂයේ ඇති වූ කොවිඩ් 19 වසන්ගත තත්ත්වය යටතේ මෙම කටයුතු තාවකාලිකව නතර විය. තවද හිඟ ආදායම් අයකර ගැනීම සම්බන්ධයෙන් සියලුම පළාත් පාලන ආයතන දැනුවත් කර ඇත. | |

(ආ) නිකුත් කර තිබුණු අධිහාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

---------------------------------------------------------------------

| | | |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට උෟව පළාතේ පළාත් පාලන ආයතනවල ධූරධාරීන්ට හා නිලධාරීන්ට එරෙහිව පනවා තිබුණු අධිහාර වෙනුවෙන් අයකර ගතයුතු රු. 5,533,839 ක් අය කර නොතිබුණි. | අධිහාර අයවීමේ ප්‍රගතිය පහත පරිදි වේ.<br>වැලිමඩ ප්‍රාදේශීය සභාව : ගෙවමින් පවතී.<br>තණමල්විල ප්‍රාදේශීය සභාව :<br>අධිහාරයට අදාළ නඩුවක් පවතී.<br>බුත්තල ප්‍රාදේශීය සභාව :<br>අභියාචනා සලකා බැලීමෙන් පසු රු. 120,850 ක් ගෙවන ලෙස දන්වා ඇතත් මෙතෙක් ගෙවා නැත.<br>සියඹලාණ්ඩුව ප්‍රාදේශීය සභාව :<br>රු. 18,008 ක් ගෙවිය යුතුව ඇත. | පනවා ඇති අධිහාර කඩිනමින් අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |